# සාමාන්‍ය සමයේ විසිඅටවන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

රෝම 1 : 16-25

"ඔව්හු මැවුම්කාරයාණන් වෙනුවට මැවිල්ලට වැඳුම් පිදුම් කළෝ ය."

මම සුබ අස්න ගැන කිසිසේත් ලජ්ජා නොවෙමි. මන්ද, අදහන්නා සියල්ලන්ට, පළමුකොට ජුදෙව්වරුන්ට ද දෙවනුව ග්‍රීකයන්ට ද එය ගැලවීම සලසන දෙවියන් වහන්සේගේ බලය වන හෙයිනි. මනුෂ්‍යයන් දේව සබඳතාවට පැමිණවීමේ මාර්ගය, මුල සිට අග දක්වා ම ඇදහිල්ලෙන් වන බව දැන් සුබ අස්න නිසා එළිදරව් වී ඇත. ශුද්ධ ලියවිලිවල සඳහන් පරිදි, "ඇදහිල්ලෙන් දේව සබඳතාවට පැමිණි අය ජීවනය අත් කර ගනිති."

අධර්මයෙන් සත්‍යයට අකුල් හෙළන මිනිසුන්ගේ අභක්තියට හා අධර්මිෂ්ඨකමට විරුද්ධ ව දේව උදහස ස්වර්ගයෙන් ප්‍රකාශ වන්නේ ය. දෙවියන් වහන්සේ ගැන දත හැකි සියල්ල ඔවුන් ඉදිරියේ සක්සුදක් සේ පැහැදිලි ය. දෙවියන් වහන්සේ ම එය ඔවුනට අනාවරණය කර දී ඇත. ලෝකය මැවූ තැන් සිට, ඇසට නොපෙනෙන උන් වහන්සේගේ දිව්‍ය ලක්ෂණ වන උන් වහන්සේගේ සදාතන බල මහිමයත් දේවත්වයත් ඔවුන්ගේ මනසට පෙනීයන පරිදි උන් වහන්සේගේ මැවිලි වලින් ප්‍රකාශ කර ඇත.

එබැවින් ඔවුන්ගේ නිදහසට ඉදිරිපත් කළ හැකි කරුණු කිසිවක් නැත. දෙවියන් වහන්සේ ගැන දැන දැනත්, උන් වහන්සේට පිදිය යුතු ගෞරවය වත්, තුති පැසසුම් වත් ඔව්හු උන් වහන්සේට නොපිදූහ. මෙසේ ඔවුන්ගේ තර්ක විතර්ක නිස්සාර බවට පත් වි, මුළාව ගිය මනස අඳුරු විය. සිය ප්‍රඥාව ගැන පුරසාරම් දෙඩූ ඔව්හු අඥානයෝ වූහ. ඔව්හු අජරාමර දෙවියන් වහන්සේගේ තේජශ්‍රීය වෙනුවට, ජරාපත්වන මිනිසුන්ගේ ද පක්ෂීන්ගේ ද සිව්පාවුන්ගේ ද උරගයන්ගේ ද සමානකම් ඇති පිළිරූ යොදා ගත්හ.

එබැවින් දෙවියන් වහන්සේ ඔවුන්ගේ මාංශික තෘෂ්ණාවලට ද කායික දූෂණවලට ද ඔවුන් පාවා දුන් සේක. එසේ කළේ ඔවුන් දෙවියන් වහන්සේගේ සත්‍යය වෙනුවට මිථ්‍යාවක් වැළඳගෙන, මැවුම්කාරයාණන් වෙනුවට මැවිල්ලට වැඳුම් පිදුම් හා ගැතිකම් කළ නිසා ය. උන් වහන්සේට සදහට ම ප්‍රශංසා වේවා! ආමෙන්.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 19 : 1 – 4

පිළිතුරු: අහස් තලය දෙවි මහිමය ප්‍රකාශ කරන්නේ ය.

ගීය:

අහස් තලය දෙවි මහිමය ප්‍රකාශ කරන්නේ ය.
ගුවන් තලය එතුමන්ගේ අත්කම් විදහා පාන්නේ ය.

එක් දිනක් තව දිනකට මෙපුවත කියන්නේ ය.
එක් රැයක් තව රැයකට එය ම පවසන්නේ ය.

කතාවක්, වදනක්, කිසියම් හඬක් ඇසෙන්නේ නැති වුව ද
ඒ පණිවුඩය ලොව පුරා පැතිරී යන්නේ ය.
එය දියත දසත විහිදී යයි. දෙවිතුමාණෝ හිරුට එහි මණ්ඩපයක් සාදා දුන් සේක.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"සමිඳුනි, දයාවෙන් අප දෙස බැලුව මැනව.
ඔබේ පණත් අපට ඉගැන්නුව මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේගේ වචනය ජීවමානය. ක්‍රියාශීලි ය.
සිතේ සිතුවිලි ද අරමුණු ද විමසන්නේය.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 10: 37-41

"ඔබට ඇති දෙයින් දන් දෙන්න. එවිට සියල්ලම ඔබට පිරිසිදු වන්නේය."

ජේසුස් වහන්සේගේ දේශනාවෙන් පසු එක් පරිසිවරයෙක් තමා සමග කෑමට වඩින මෙන් උන්වහන්සේට ආරාධනා කළේය. උන්වහන්සේ ඇතුළුව කෑමට වැඩහුන් සේක. කෑම කන්නට පළමුව උන්වහන්සේ අත් සේදීමේ පිළිවෙත ඉටු නොකළ බැව් දුටු පරිසිවරයා පුදුම විය. ස්වාමීන් වහන්සේ ඔහුට මෙසේ වදාළ සේක.

"පරිසිවරුනි, ඔබ කෝප්පයේ ද පිඟානේ ද පිට පැත්ත සෝදා පිරිසිදු කරන්නහු ය. එහෙත් ඔබගේ ඇතුළත තණ්හාවෙන් ද දුෂ්ට චේතනාවෙන් ද පිරී ඇත. ආඥානයෙනි, පිට පැත්ත මැවූ තැනැන් වහන්සේ ඇතුල් පැත්තත් නොමැවූ සේක් ද? එසේ නම් ඔබට ඇති දෙයින් දන් දෙන්න. එවිට සියල්ලම ඔබට පිරිසිදු වන්නේ ය."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.